# තේ තතු

දෙවන කලාපය

ISSN - 1391-6785

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශණයකි

පළවෙනි කාණ්ඩය, දෙවෙනි කලාපය 2001 ජූලි - දෙසැම්බර්


## නුපුහුණු ශ්‍රමය හමුවේ කුඩා තේ ඉඩම් වල ඵලදායිතාවය අඩාල වේද?

ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයේදී කුඩා තේ වතු හිමියන්ගේ කාර්‍යයභාරය අන් කවර දා ටත් වඩා අද ඉතා වැදගත් වී ඇත්තේ ජාතික තේ නිෂ්පාදනයෙන් 60% ට වඩා වැඩි ප්‍රමාණයකට ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය නිසාය. වතු අංශයේ මෙන් නොව මෙම ඉඩම් බොහෝමයක රිකිලි තේ වගාවන් දක්නට ලැබීම මෙයට එක් හේතුවකි. මනා කෘෂිකාර්මික කළමනාකරණ තත්ත්වයක් යටතේ දී හොඳ අස්වැන්නක් ලබා ගත හැකි වනවා සේ ම වැරදි කෘෂිකාර්මික කටයුතු නිසා ඉතා ඉක්මනින් ම පඳුරු වල තත්ත්වය දුර්වල වී අස්වැන්න අඩු වී යාම මෙම රිකිලි තේ ප්‍රභේද වල සුවිශේෂ ලක්ෂණයකි. මේ නිසා තම ඉඩම් වල ඵලදායිතාව තිරසාර ලෙස ඉහල අගයක පවත්වා ගැනීමට නම්, කුඩා තේ වතු හිමියන් තම ඉඩම් වල කෘෂිකාර්මික කටයුතු වල නිරවද්‍යතාව හා ගුණාත්මය යන කරුණු පිළිබඳ මනා අවධානයක් යොමු කිරීම ඉතා වැදගත් ය. මෙම කටයුතු සඳහා යොදාගන්නා ශ්‍රමයේ ගුණාත්මකභාව එනම් දැනුම හා කුසලතාව ඉතා වැදගත් ය.



වැරදි ලෙස කප්පාදු කළ ඉඩමක්

කප්පාදු කිරීම, තවාන් පාලනය හා දළු නෙලීම යන කටයුතු බෙහෙවින් ම පුහුණු ශ්‍රමය අවශ්‍ය කරන කටයුතු කීපයකි. එසේ වුවද සොයා ගැනීමේ අපහසුතාවය නිසා කුඩා තේ වතු හිමියන් විසින්, පවතින නුපුහුණු ශ්‍රමය තම එදිනෙදා කටයුතු සඳහා යොදාගනු ලැබේ. රජයේ හෝ සමාගම් වතු වල වැඩ කරන කම්කරුවන් බොහෝ දෙනෙකු නිවැරදි කෘෂිකාර්මික ක්‍රම පිළිබඳ මනා අවබෝධයක් ඇති අය බවට කුඩා තේ වතුහිමියන් බොහොමයක් තුල ආකල්පයක් ඇත. මේ නිසා ඔවුන්ට කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම් වල පාලනයකින් හා මනා සුපරීක්ෂාවකින් තොරව නිදහසේ තම කටයුතු කිරීමට ඉඩකඩ ලැබී ඇත. එහෙත් ඔවුන් අතින් සිදුවන ඇතැම් වැරදි ක්‍රියා නිසා කුඩා තේ වතු හිමියන්ගේ වගාවනට හානිදායක තත්ත්වයන් පැන නැගුන අවස්ථාද නැත්තේ නොවේ. විශේෂයෙන් තේ කප්පාදු කිරීමේ දී හා දළු නෙලීම තෙක් පඳුරු හැඩගැසීමේ දී අනුගමනය කරන කෘෂිකාර්මික පිළිවෙත් වල අඩුපාඩු නිසා හා දළු නෙලන්නියන් විසින් වියළි කාලයේදී පාලනයකින් තොරව දැඩි ලෙස දළු නෙලීම නිසා පරිහානියට පත්වූ තේ වගාවන්ද විරල නොවේ. සමහර මහා වතු සමගම් වුවද තේ පර්යේෂණායතනයේ නිර්දේශයන්ට අනුකූල නොවන කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරන අවස්ථා තිබේ. මේවා දිගුකාලින වශයෙන් තේ වගාවේ පැවැත්මට එතරම් යෝග්‍ය නොවේ. වතු ශ්‍රමය හරහා මෙම වැරදි ක්‍රම කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම්වලද භාවිතාවීම, එතරම් ශුභදායි නොවේ.

ඉහත කරුණු වඩාත් හොඳින් විග්‍රහ කිරීමේදී පෙනී යන්නේ මෙම තත්ත්වය තුළ කුඩා තේ ඉඩම්වල පැවැත්ම හා ඵලදායිතාව පිළිබඳ යම් ගැටළුකාරී තත්ත්වයක්, ඉදිරියේදී නිර්මාණය විය හැකි බවයි. කුඩා තේ වතු හිමියාගේ ඉඩම තුළ බාහිර ශ්‍රමය නිසි ලෙස කළමනාකරණය කර නොගැනීම ද ප්‍රධාන වශයෙන් මේ තත්ත්වයට හේතු පාදක වී ඇත. මේ තත්ත්වයෙන් ගැලවීම සඳහා කුඩා තේ වතු හිමියා තුළ ද නිවැරදි කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය.



වියලි කාලයේදී රළු ලෙස දළු නෙලීම නිසා විනාශ වූ තේ පඳුරක්

එබැවින් නිවැරදි කෘෂිකාර්මික කටයුතු පිළිබඳ මනා අවබෝධයකින් යුතුව බාහිර ශ්‍රමය තම වගාවේ කටයුතු සඳහා මෙහෙයවමින් ඵලදායීතාව වැඩිකර ගැනීමට කටයුතු කිරීම කුඩා තේ වතු හිමියාගෙන් සිදුවිය යුතු ජාතික මෙහෙවරක් බව අවසන් වශයෙන් සටහන් කරණු කැමැත්තෙමි.

- ආර්.එම්.ඒ.සී. රාජකරුණා